සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education – Western Province**

**ශිෂ්‍යත්ව ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2026**
**පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**කට්ටල අංක 07**

**EXAMINATION FOR GRADE FIVE STUDERNTS FOR SELECTION TO SCHOOL AND FOR THE AWARD OF BURSARIES**
**පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය**

**I පත්‍රය**

කාලය : පැය එකයි

විභාග අංකය : ..................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණු | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි. | |
| | V/I/S |
| දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | |
| | V/II/S |
| ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | |
| | V/II/S/EMF |
| ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය. | |
| | V/II/S/CH |


**01.** මේස් හතරක රූප පහක් A , B , C , D , E මගින් දැක්වේ.




ඒවා අතුරෙන් එකම මේස් කුට්ටම දැක්වෙන රූප දෙක මොනවා ද?


1. A සහ D  2. B සහ D  3. C සහ E

02. පහත ඇති උපකරණ කාණ්ඩ කීයකට වෙන් කළ හැකි ද?



1. 2
2. 3
3. 4

03. කඩදාසිය මතින් පැන්සල ඉවතට නොගෙන එකම මාර්ගයේ එක්වරකට වඩා නොයන සේ මෙම රූපය ඇඳීමට අවශ්‍ය වේ. රූපය ඇඳීම ආරම්භ කළ යුත්තේ කුමන ස්ථානයෙන් ද?




1. A
2. B
3. C

04. පහත කවියෙන් කියවෙන්නේ කුමක් ගැන ද?

කොළ පැහැ සිනිඳු ලෙල්ලෙන් වැසුණු
බීජය වට ළා කොළ මදයෙන් පිරුණු
හදවත දෙඇසට ගුණයෙන් පිරුණු
ඉදුණු විටදී දම්පැහැයට හැරුණු


1. මැංගුස්  2. අලිගැටපේර  3. පේර

05. පහත සටහනේ හිස්තැන සඳහා වඩාත් සුදුසු වචනය පිළිවෙළින් ඇතුළත් පිළිතුර කුමක් ද?

| | | |
|---|---|---|
| i .................. | දෙල් | කැරට් |
| මුං ඇට | බත් | iii .................. |
| දඹල | ii .................. | අන්නාසි |


1. මාළු , අඹ , පරිප්පු
2. බිත්තර , කංකුං , මුකුණුවැන්න
3. මාළු , ඉදිආප්ප , ගොටුකොළ

06. රටාව හඳුනාගෙන හිස්තැනට ගැළපෙන පිළිතුර සොයන්න.





1. 21  2. 19  3. 18

07. රටාව හඳුනාගෙන ? ලකුණ යෙදී ඇති ස්ථානයට ගැළපෙන පිළිතුර තෝරන්න.




1. 25  2. 37  3. 50


08.






රූපයේ දැක්වෙන්නේ පෙ.ව. 6.55 ට 800m ක් දිග විදුලි දුම්රියක් 1 km 360m ක් දිග බිං ගෙයකට ඇතුළුවන අවස්ථාවකි. එම දුම්රිය තත්පරයක කාලයකදී 4 m දුරක් ගමන් කරයි නම්, දුම්රිය සම්පූර්ණයෙන් පාලම පසු කරන විට වේලාව කීය ද?

1. පෙ.ව. 7.23  2. පෙ.ව. 6.44  3. පෙ.ව. 7.04


09. පහත ඇති විස්තරය අනුව සති පොළේ වෙළඳසැල් සකස්කර ඇති නිවැරදි දළ සටහන කුමක් ද? සති පොළේ මාළු වෙළඳසැල ඇළ සමීපයේ ඇත. සති පොළේ පිවිසුම් දොරටුව අසල පලතුරු වෙළෙඳ සැල පිහිටයි. පලතුරු වෙළඳසැලට නැගෙනහිරින් එළවළු වෙළඳ සැල පිහිටයි. සති පොළේ මැද කඩචෝරු විකුණයි. කඩචෝරු වෙළඳසැලට වයඹින් මාළු වෙළෙඳසැල පිහිටයි.

1.



2.




3.




10. රූපයේ දැක්වෙන පරිදි සෘජුකෝණාස්‍රාකාර හැඩය මත ත්‍රිකෝණ හැඩතල දෙකක් තබා කඩ ඉරි දිගේ කැපූ විට ලැබෙන ත්‍රිකෝණ හැඩතල ගණන කීය ද?





1. 10
2. 6
3. 8

11. මුල් කොටුව තුළ ඇති රූපයට බොහෝ සෙයින් සමාන රූපය තෝරන්න.




1. 

2. 


3. 


12. පහත කොටුව තුළ සරල රේඛා කීයක් දැකිය හැකි ද?





1. 15
2. 16
3. 17

13. හිස්තැනට ගැළපෙන රූපය තෝරන්න.





1. 


2. 


3. 


**✷ රටාව අනුව හිස් තැනට ගැළපෙන රූපය තෝරන්න.**


14. 


1. 


2. 

3. 

15. 

1. 

2. 

3. 

16. A B C තිදෙනා ප්‍රශ්න 7 කට සැපයු පිළිතුරු හා ලැබුණු පිළිතුරු හරි හෝ වැරදි ලෙස පහත දක්වා ඇත.

| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
|---|---|---|---|---|---|---|---|
| A | F | T | T | F | F | T | T |
| B | T | F | F | T | T | T | F |
| C | T | T | F | F | T | T | T |


**T** - හරි පිළිතුර

**F** - වැරදි පිළිතුර

A හා B දෙදෙනාම ලකුණු 6 බැගින් සමානව ලබා ගත්තේ නම් C ගේ ලකුණු සම්බන්ව නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. හයට වඩා වැඩි ය  2. හයට වඩා අඩු ය  3. හයට සමාන ය

✷ **පහත දක්වා ඇති පතරොම දාර වලින් නැවීමෙන් ඝනකයක් ලබා ගත හැකිය. ඒ ඇසුරින් පිළිතුරු තෝරන්න.**




17. 1 ඉලක්කම විරුද්ධ පැත්තේ ඇති ඉලක්කම විය හැක්කේ,

1. 5  2. 4  3. 3

18. 2 ඉලක්කමට යාබද පැති හතරේ ඇති ඉලක්කම්වල එකතුව වන්නේ,

1. 15  2. 18  3. 13

19. සුනිමල්ගේ ඔරලෝසුවේ වේලාව සෑම පැයකටම මිනිත්තු 1 , 2 , 3 , 4 ආදි වශයෙන් අඩුවෙන් යයි. ඔහුගේ ඔරලෝසුවේ පැය 4 කට පෙර වේලාව නිවැරදි කළ පසු වේලාව ප.ව. 4.50 නම් දැන් ඔරලෝසුවේ වේලාව කීය ද?

1. ප.ව. 5.00  2. ප.ව. 4.55  3. ප.ව. 4.56

20. පහත සංඛ්‍යා ගොඩ නගා ඇති රටාව අනුව හිස්තැනට ගැළපෙන සංඛ්‍යාව තෝරන්න.

43215 → 746  52104 → 724
81334 → 967  53243 → 847
32453 → ……..

1. 528  2. 588  3. 584

21. A ගේ වයස C ගේ වයසින් භාගයකි. C ගේ වයස B ගේ වයස මෙන් තුන් ගුණයකි. D ගේ වයස A හා B ගේ වයස්වල එකතුවට සමාන ය. B ගේ වයස අවුරුදු 20 ක් නම් වයසින් වැඩි ම හා අඩු ම කෙනා දැක්වෙන පිළිතුර වන්නේ,

1. A හා B  2. C හා B  3. B හා A


22. පාසල් වෑන් රථයක් ගමන ආරම්භයේදී සිසුන් 8 ක් සිටි අතර ආරම්භක ස්ථානයේ සිට 4km ක් ගිය පසු විමල් ගොඩ විය. විමල් ගොඩ වී 2 km ක් ගිය පසු සුමල් ගොඩ වේ. සුමල් ගොඩවීමට 3 km කට පෙර අනිල් ගොඩ වේ. අනිල් ගොඩ වී 4 km ක් ගිය පසු සුසිල් ගොඩ විය. විමම් ගොඩ වී 6 km ක් ගිය පසු නිමල් ගොඩ විය. නිමල් ගොඩ වී 2 km ක් ගිය පසු සියලු දෙනා පාසල අසලින් බැස ගියහ. වෑන් රථය ආරම්භක ස්ථානයේ සිට පාසල වෙත ගමන් කළ මුළු දුර කොපමණ ද?

1. 21 km  2. 16 km  3. 12 km

23. සිසුවෙක් තම වාර විභාගයේ දි මව්බස , ඉංග්‍රීසි සහ පරිසරය විෂය සඳහා ලබා ගත් ලකුණු එකතු කර තුනෙන් බෙදූ විට එක් විෂයක් සඳහා ලබා ගත් ලකුණු ප්‍රමාණය 67 ලෙස සටහන් විය. ඔහු එයට ගණිතය විෂය ලකුණු එකතු කර 4 න් බෙදූ විට එක් විෂයක් සඳහා ලබාගත් ලකුණු ගණන 70 ක් ලෙස සටහන් වුණි. මේ අනුව ඔහු ගණිතය සඳහා ලබා ගත් ලකුණු ප්‍රමාණය වන්නේ,

1. 70 2. 79 3. 67

24. පහත රූපයේ දැක්වෙන්නේ කුඩා ඝනක එක් රැස් කොට සකස් කරන ලද විශාල ඝනකයකි. එහි රූපයේ දක්වා ඇති ආකාරයට රිබන් ඔතා ඇත. එම රිබන් පටිය ස්පර්ෂ වී ඇති කුඩා ඝනක ගණන කීය ද?



1. 24
2. 14
3. 16

25. ළමයෙක් රථ ගාලක නවතා තිබූ බස්රථ, මෝටර් රථ, ත්‍රිරෝද රථ හා යතුරු පැදිවල රෝද ගණන ගනන් කර එහි මුළු එකතුව සටහන් කළේ 13 ක් ලෙසය. එහි තිබූ වාහන සංඛ්‍යාව විය නොහැක්කේ,

1. බස් රථ 1 , මෝටර් රථ 1 , ත්‍රිරෝද රථ 1
2. මෝටර් රථ 2 , ත්‍රිරෝද රථ 1 , යතුරු පැදි 1
3. ත්‍රිරෝද රථ 2, මෝටර් රථ 1 , යතුරු පැදි 2

26. පහත A රූපයේ ඇති තීන්ත ආලේපිත කොටු ජාලය මත එවැනිම ප්‍රමාණයේ තවත් කඩදාසියක් තබා තීන්ත තැවරුණු පසු එය ඉවතට ගනියි. එසේ ඉවතට ගත් කඩදාසිය නිවැරදිව දැක්වෙන්නේ පහත ඒවායින් කුමන රූපයේ ද?

| | | |
|---|---|---|
| A | B | C |
| D | E | F |
| G | H | I |

1.

| | | |
|---|---|---|
| Ɔ | ꓭ | A |
| ꟻ | Ǝ | ᗡ |
| I | H | ⅁ |


2.

| | | |
|---|---|---|
| A | B | C |
| D | E | F |
| G | H | I |

3.

| | | |
|---|---|---|
| A | ꓭ | Ɔ |
| ᗡ | Ǝ | ꟻ |
| ⅁ | H | I |

27. ඇතුළත ටෙනිස් බෝල අසුරා පෙට්ටි කිහිපයක් ගොඩ ගසා ඇති ආකාරය පහතින් දක්වා ඇත. එහි බෝල 10, 12 , 14 , 16 , 18 , 20 බැගින් තිබෙන අතර ඒවා A , B, C , D , E , F ලෙස නම් කර ඇත. (පිළිවෙළින් නොවේ) පෙට්ටි පිළිබඳ ප්‍රකාශ පහතින් දැක් වේ.




✶බෝල 18 ක් ඇති පෙට්ටිය තවත් පෙට්ටි 4 ක ස්පර්ෂ වේ.

✶බෝල 10 ක් ඇති පෙට්ටිය තවත් පෙට්ටි දෙකක ස්පර්ෂ වේ.

✶බෝල 16 ක් සහිත පෙට්ටිය බෝල 18 ක් සහිත පෙට්ටි දෙකක ස්පර්ෂ වේ.

ඉහත විස්තර අනුව බෝල 18 ක් සහිත පෙට්ටියක් විය නොහැක්කේ කුමන පෙට්ටියද?

1. B 2. E 3. C

28. ළමයි හතර දෙනෙකුගේ වයස් පිළිබඳ තොරතුරු පහත දැක්වේ. සෙනත් හා මතිලගේ වයස්වල එකතුව අවුරුදු 13 කි. මිනුල හා තිසෙව්ගේ වයස්වල එකතුව අවුරුදු 35 කි. මතිලගේ හා මිනුලගේ වයස්වල එකතුව අවුරුදු 19 කි. සෙනත් හා මිනුලගේ වයස්වල එකතුව අවුරුදු 18ක්. ඉහත විස්තරය අනුව වයසින් බාලම කෙනාගේ නම කුමක් ද?

1. මිනුල 2. මතිල 3. සෙනත්

29. 2024 වර්ෂය සඳහා දින 53 බැගින් යෙදෙන දවස් 2 ක් ද 2025 වර්ෂය සඳහා දින 53 බැගින් යෙදෙන 1 ක් ද ඇත. මේ අනුව 2026 වර්ෂය සඳහා දින 52 බැගින් යෙදෙන දවස් කීයක් තිබේද?

1. 1 2. 2 3. 6


30. බල්බ් 47 ක් ඇති බල්බ වැලක නිල් , රතු , කහ යන බල්බ පිළිවෙළින් දැල්වේ. එහි ඇති රතු හා කහ බල්බවල එකතුව විය හැක්කේ,

1. 16 2. 31 3. 32

31. බදාදා දවසකින් ආරම්භ වන ජුලි මාසයක දිනවල එකතුව ඔත්තේ සංඛ්‍යාවක් වන්නේ පහත දැක්වෙන කුමන දවස්වලදී ද?

1. සඳුදා - අඟහරුවාදා 2. බදාදා - බ්‍රහස්පතින්දා 3. බදාදා - සිකුරාදා

32. පළල මෙන් දිග දෙගුණයක් වූ සෘජුකෝණාස්‍ර කිහිපයක් පහත ආකාරයට තබා ඇත. එම රූපයේ වටේ දිග වන්නේ,




1. 28 cm 2. 36 cm
3. 40 cm

33. සැන්දෑවේ මා පාසල අවසන් වී නිවසට යන විට සෙවණැල්ල මගේ ඉදිරියේ ගමන් කළේ ය. එවිට මගේ මිතුරා ද මා ඉදිරියට පැමිණි අතර අප දෙදෙනා මදක් කතාකරමින් සිටියෙමු. ඒ අනුව අපගේ සෙවණැල්ල වැටී ඇති ආකාරය පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ,

1. මාගේ සෙවණැල්ල නැගෙනහිරට , මිතුරාගේ සෙවණැල්ල බටහිරට වැටී ඇත.
2. මිතුරාගේ සෙවණැල්ල බටහිරට , මාගේ සෙවණැල් නැගෙනහිරට වැටී ඇත.
3. අප දෙදෙනාගේම සෙවණැල්ල නැගෙනහිරට වැටී ඇත

34. ක්‍රීඩා පිටියේ පැවැත්වෙන සරඹ සංදර්ශනය සඳහා අඳින ලද වෘත්ත රටාවක පිහිටීම පහත දැක්වෙන අතර ළමයෙක් A ස්ථානයේ සිට B , C , D , E හරහා F දක්වා ගමන් කරන අතර තුර EF රේඛාවේ හරි මැදින් G ස්ථානයේ නවතියි. ඔහු ගමන් කළ දුර වන්නේ,




1. 22 m
2. 18 m
3. 16 m

35. අමර , සමන් , කුමාර ඉලිප්සාකාර ධාවන පථයක එකම ස්ථානයකින් පටන් ගෙන දිවීමේ තරඟයක නිරත වෙයි. අමරට තරඟය අවසන් කිරීමට මිනිත්තු 6 ක් ගතවෙයි. සමන් , අමර මෙන් දෙගුණයක වේගයෙන් දුවයි. කුමාර අමරගේ වේගයෙන් භාගයක වේගයෙන් දුවයි. තිදෙනාටම තරඟය අවසන් කිරීමට ගතවන කාලය කොපමණ ද?

1. මිනිත්තු 21 2. මිනිත්තු 12 3. මිනිත්තු 18

36. වෘත්තාකාර ලෙස සිටගෙන සිටින සිසුන් පස් දෙනෙකු ස්ථානගත වී ඇති ආකාරය පහත දැක්වේ.

- මිහෙළිට දකුණු අත පැත්තෙන් තිලිනි සිටින අතර සයුරි සිටින්නේ මිහේළිට වම් පැත්තෙනි.
- තිලිනි සහ චිරනි අතර පවනි සිටින අතර චිරනි සයුරිට වම් අත පැත්තේ සිටියි.
- පසුව පවනී සහ මිහෙළි ස්ථාන මාරුකරගත් අතර සයුරි සහ චිරනිද ස්ථාන මාරු කර ගන්නා ලදී.
- නැවත තිලිනි සහ සයුරි ස්ථාන මාරුකර ගත්තේ නම් ස්ථාන මාරුකර ගත්විට චිරනි දෙපස සිටින්නේ කවුද?


1. පවනී , සයුරි　　2. පවනී , තිලිනි　　3. මිහෙළි , සයුරි

37. අම්මා සෑම දිනකම ප.ව. 6.30 වන විට ''පුතේ දොර බාගෙට වහන්න ලෙස පවසයි. තාත්තා ප.ව. 6.35 වන විට දොරවල් ඇරීම හා වැසීම පිළිබඳ උපදෙසක් ලබා දුන් අතර පුතා එම උපදෙස් ක්‍රියාත්මක කළ නමුත් දොර තවත් ආකාරයේ වෙනසක් නොවිය. තාත්තා ලබා දුන් උපදෙස වන්නේ කුමක් ද?

1. 'දොර වහන්න' ලෙස　　2. 'දොර අරින්න' ලෙස


3. 'දොර බාගෙන අරින්න' ලෙස




38. කුඩා ඝනක අලවා සාදන ලද ඝනක තුනක් පහත දැක්වේ. එම ඝනක තුන එකිනෙකට අලවා විශාල ඝනකයක් සෑදීමට තව අවශ්‍ය වන අවම කුඩා ඝනක ගණන කොපමණ ද?




1. 24　　2. 40　　3. 48

39. විනිවිද පෙනෙන කොළ තුනක අඳින ලද මෝස්තරයක් පහතින් දැක්වේ. එම විනිවිද පෙනෙන කොළ තුන එක මත එක තැබූ විට පෙනෙන නිවැරදි ආකාරය වන්නේ,



1. 　　2. 　　3. 

40. විදුලි වයර් පද්ධතියක දෝෂයක් නිසා විදුලි බුබුළක් දැල්වීමට පහත A හා B පුවරු දෙකේම ස්විච් දෙකක් එකවර ක්‍රියාත්මක කළ යුතුය. එසේ නම් අනිවාර්යෙන්ම විදුලි බුබුළ දැක්වෙන්නේ කීවෙනි උත්සහයේදී ද?



1. 4　　2. 11　　3. 12

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education – Western Province

ශිෂ්‍යත්ව ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2026

කට්ටල අංක 07

පෙරහුරු ප්‍රශ්න පත්‍රය

**EXAMINATION FOR GRADE FIVE STUDERNTS FOR SELECTION TO SCHOOL AND FOR THE AWARD OF BURSARIES**

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය

කාලය : පැය එකයි මි. 15

**II** පත්‍රය

විභාග අංකය : ................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 61 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණු | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි. | |
| | V/I/S |
| දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | |
| | V/II/S |
| ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | |
| | V/II/S/EMF |
| ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය. | |
| | V/II/S/CH |

01. **පහත දැක්වෙන ඡේදය කියවන්න.**

හිරු පායා ආ උදෑසන සිට ම බොහෝ කාර්යයන්හි නිරත වූ මිනිස්සු තම වාසස්ථාන කරා ඇදී යන්නට වූහ. උදයේ පිපුණු බොහොමයක් මල් කෙමෙන් කෙමෙන් පරවී යන්නට පටන් ගත්ත ද හෙන්දිරික්කා පඳුර පමණක් නෙක වර්ණයෙන් හිනැහෙන්නට පටන් ගත් ආකාරය දක්නට ලැබුණි. උදෑසන ඇසෙන මිහිරි කුරුලු නාදය වෙනුවට ගෙම්බන්, රැහැයියන් නගන අමිහිරි නාද පැතිරෙන්නට විය. දිවා කල ගතට දැනෙන හිරු රශ්මිය අඩු වී ඇත. බටහිර අහසේ අලංකාර සිතුවමක් අඳිමින් හිරු මෝදු වන සඳ පිළිගන්නට සැරසෙන්නාක් මෙන් මුහුදු කුස නොපෙනී ගියේ ය.

✷ **ඡේදය ඇසුරින් ම පිළිතුරු ලියන්න.**

1. ඡේදයේ සඳහන් පරිදි පිපී ඇති මල් වර්ගය කුමක් ද? ..............................................................

2. ''නොයෙක්'' යන පදයට සමානාර්ථ පදයක් ඡේදයෙන් සොයා ලියන්න.

   ..............................................................................................................................

3. ''මිනිස්සු තම වාසස්ථාන කරා ඇදී යන්නට වූහ''. ඉහත වාක්‍ය වර්තමාන කාල ඒක වචන වාක්‍යයක් ලෙස ලියන්න.

   ..............................................................................................................................

4. මෙහි සඳහන් පරිදි අමිහිරි නාද නගන්නේ කවුරුන් ද? ..............................................................

5. බටහිර අහසේ අලංකාර සිතුවමක් ඇන්දේ කවුද? ..............................................................

6. ඡේදයේ සඳහන් පරිදි ගතට වෙහෙස දැනෙන්නේ කවර කාලයේ ද?

   ..............................................................................................................................

02. **පහත සඳහන් එක් එක් වාක්‍ය සඳහා ගැළපෙන ආඛ්‍යාත පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

1. ඔවුහු අත්පොළසන් දෙමින් ප්‍රීති ...................................... (වෙයි / වෙති)
2. ගංගා උතුරා පිටාර ...................................... (ගැලූහ / ගැලුවේ ය)
3. අපි පරිසරයට ආදරය ...................................... (කරති / කරමු)
4. නංගීත් මමත් රාත්‍රී අහස දෙස ...................................... (බැලුවෙමු / බැලුවෝ ය)

03. **පහත සඳහන් අවස්ථාවට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තිත් ඉර මත ලියන්න.**

අනුන් රවටන්නට ගොස් තමන් රැවටීම

..............................................................................................................................

04. **නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන යටින් ඉරක් අඳින්න.**

1. විදුහල්පතිතුමා පාසලේ කසළ ...................................... හොඳින් ක්‍රියාත්මක කරයි.

   (කළමණාකරනය / කළමනාකරණය)

2. ඉමේෂ් ක්‍රීඩාවෙන් ...................................... ජයග්‍රහණ රැසක් ලබා ගත් ශිෂ්‍යයෙකි.

   (විශිෂ්ට / විශිෂ්ඨ)

05. **පහත වගන්තිය ලිඛිත බසට හරවා ලියන්න.**

ශිෂ්‍යයා පිට්ටනියට ගිහින් ක්‍රීඩා කරන්නට සූදානම් වුණා.

..............................................................................................................................

06. **සුදුසු විරාම ලකුණු යොදන්න.**

සමන්ගේ පොත් බෑගයේ මව්බස ගණිතය සහ චිත්‍ර පොත් තිබුණි

07. **දී ඇති වචන ගළපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.**

දරුවන්ගේ / වැඩිහිටියන්ට / යහපත් / කිරීම / ගෞරව / යුතුකමකි

.................................................................................................................................

08. **පහත සඳහන් ගීත කොටසේ දැක්වෙන උපමාව තෝරා ලියන්න.**

**ගස් අස්සෙන් තීරු තීරු - එන හිරු රැස් සාරි වගෙයි**

**අම්මට දෙන්නට හිතුණත් - අල්ල ගන්න බැරි ගානයි**

.................................................................................................................................

09. **පහත දැක්වෙන යුගල පදය සම්පූර්ණ කරන්න.**

1. .......................... සෙල්ලම් 2. අහල ..........................

10. **ඒක වචන පුරුෂ ලිංග අනුක්ත පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

දරුවෙක් , මිනිසෙකු , කුරුල්ලෙක්

11. **පහත සඳහන් අවස්ථාවට ගැළපෙන ඉඟි වැකිය ලියන්න.**

ඉටු නොවන සිහින මැවීම - ...............................................................................................

12. **පහත සඳහන් වාක්‍යය අතීත කාල ඒක වචන වාක්‍යයක් ලෙස ලියන්න.**

ගොවියෝ කුඹුරේ ගොයම් කපති.

.................................................................................................................................


13. **පහත සඳහන් වචනවල ඉරි ඇඳි අකුරේ ඇති පිල්ලම තිත් ඉර මත ලියන්න.**

1. රුස්වීම - ...................................... 2. සමෘද්ධිමත් - ..............................................

14. **පහත සඳහන් තේරවිල්ල තෝරා පිළිතුර ලියන්න.**

ගසක නොපිපෙන මල - ..........................................................................

15. **එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.**

1. 

2. 

16. (අ) **පහත දී ඇති වචන ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.**

1. four / legs / My / has / dog

.................................................................................................................

2. pencil / give / Please / your / me

.................................................................................................................

**(ආ) එක් එක් ඉංග්‍රීසි වචනයෙහි අර්ථය සිංහල අකුරෙන් ලියන්න.**

1. knife - .......................................... 2. train - ..........................................

**17. (අ) පහත සඳහන් සිංහල වාක්‍යය දෙමළ බසින් කියන ආකාරය සිංහලෙන් ලියන්න.**

1. මට වතුර ඕනෑ - ..........................................................................................

**(ආ) "වෙල්ලික් කිළමෙ"** යන දෙමළ වාක්‍යයේ සිංහල අර්ථය සිංහල අකුරෙන් ලියන්න.

..................................................................................................................................


**18. පහත දැක්වෙන සංඛ්‍යාවෙහි සංඛ්‍යාංකය ලියන්න.**

විසි අටදහස් අනූ අට - ..........................................................................................

19. **දී ඇති සංඛ්‍යා අවරෝහණ පටිපාටියට සකස් කර ලියන්න.**

3509 , 3590 , 2905 - ..........................................................................................

20. පාට කළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.



..........................................

21. දස දහසස්ථානයේ 8 , දහයස්ථානයේ 5 , සියස්ථානයේ 2, එකස්ථානයේ 0 , දහසස්ථානයේ 9 වන සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න. ..........................................................................

✷ **කර්මාන්ත ශාලාවක මාස හතරක් තුළ නිපද වූ පැන්සල් පෙට්ටි ප්‍රමාණයන් පහත දැක්වේ. ඒ ඇසුරින් අංක 24 හා 25 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| **මාසය** | **පැන්සල් පෙට්ටි ප්‍රමාණය** |
|---|---|
| ජනවාරි | 2368 |
| පෙබරවාරි | 510 |
| මාර්තු | 4185 |
| අප්‍රේල් | 3615 |

22. 1. පෙබරවාරි මාසයේ හා මාර්තු මාසයේ නිපද වූ පැන්සල් පෙට්ටි ප්‍රමාණය කොපමණ ද?

..........................................................................................

2. ජනවාරි මාසයට වඩා අප්‍රේල් මාසයේ නිපද වූ පැන්සල් පෙට්ටි ප්‍රමාණය කොපමණ ද?

..........................................................................................

23. පහත සංඛ්‍යා රටා තේරුම්ගෙන හිස්තැන් පුරවන්න.

1. 86 , 95 , ........... , 113 , ........... 2. 72 , 64 , 56 , .......... , 40 , .............

24. මල් වට්ටියක රෝසමල් 108 ක් තිබුණි. එවැනි වට්ටි 4 ක ඇති රෝස මල් ගණන කීය ද?

..........................................................................................

25. පොත් 915 ක් එක් ළමයෙකුට 3 බැගින් බෙදා දුන්නේ නම් ළමයි කී දෙනෙකුට පොත් ලබාදිය හැකි ද? ..........................................................................................


26. පහත සඳහන් වගුව පුරවන්න.

| **පැය 24 ඔරලෝසුවේ වේලාව** | **පැය 12 ඔරලෝසුවේ වේලාව** |
|---|---|
| 11 : 05 | ...................................... |
| ...................................... | ප.ව. 2.30 |

27. පහත බිල්පත සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍යය | මිල දී ගත් ප්‍රමාණය | 1kg ක මිල | | වටිනාකම | |
|---|---|---|---|---|---|
| | | රුපියල් | සත | රුපියල් | සත |
| සීනි | 2 kg | 110 | 50 | (ii) .............. | ........ |
| පරිප්පු | 500 g | (i) .............. | ........ | 140 | 00 |
| පිටි | 250 g | 136 | 00 | (iii)........... | ........ |
| මුළු මුදල | | | | (iv) .............. | ........ |


28. පහත සඳහන් ඝන වස්තුවට අයත් ශීර්ෂ ගණනේත් මුහුණත් ගණනේත් එකතුව ලියන්න.



.........................................

29. මිතුරට 20 km ක දුරක් යා යුතුව ඇත. ඔහු එයින් 13 km 750 m ක දුරක් බස් රථයෙන් ගිය අතර ඉතිරි දුර යතුරු පැදියකින් ගමන් කළේ ය. ඔහු යතුරු පැදියෙන් ගමන් කළ දුර කොපමණ ද? ..............................................................................................

30. දින 5 ක් තුළ විකුණන ලද ළමා පොත් පත් කිහිපයක් පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරයේ දැක්වේ.




1. වැඩියෙන් ම විකුණන ලද පොත් ප්‍රමාණය කීය ද? ........................
2. දින පහ තුළ විකුණු මුළු පොත් ගණන කොපමණ ද? ..................

✷ ප්‍රශ්න අංක 31 සිට 60 දක්වා ප්‍රශ්න වලට ගැළපෙන නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

31. සහනශීලීව අදහස් ප්‍රකාශ කිරීමට අදාළ වැරදි ප්‍රකාශයක් වන්නේ,

1. වගකීම් දැරීමට හුරුවීම 2. ගැටුම් වැළකී නොයෑම
3. අන් අයගේ ගරුත්වය ආරක්ෂා වීම

32. "මුළු ලෝකය ම දිනන්න මට පුළුවන්"මෙය සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමෙහි කුමන පියවරකට අයත් වේ ද?

1. උදානය 2. අධිෂ්ඨානය 3. ශාරීරික ලිහිල් බව

33. ජාතික කොඩියෙහි හා රාජ්‍ය ලාංඡනය යන දෙකට ම පොදු වූ රූපය වන්නේ,

1. බෝපත් 2. සිංහයා 3. වී කරල්

34. තම ගෙල එක් කඩු පහරකින් වෙන් කරන ලෙස ඉල්ලූ රූපයේ සඳහන් වීරවරයා වන්නේ,



1. ගොංගාලේ ගොඩ බණ්ඩා
2. ඇහැලේපොළ අදිකාරම්
3. මොනරවිල කැප්පෙටිපොළ දිසාව

35. ඖෂධිය ශාකයක් සකස් කර ගැනීමට යොදා ගන්නා මල් වර්ගයක් නොවන්නේ,

1. රණවරා 2. බෙලි 3. හාතාවාරිය

36. අප තොරතුරු ලබා ගන්නා විද්‍යුත් මාධ්‍ය පමණක් දැක්වෙන පිළිතුර වන්නේ,


1. දුරකථනය , ගුවන් විදුලිය , ෆැක්ස් 2. අන්තර්ජාලය , ඊ මේල් , පෝස්ටර්
3. රූපවාහිනිය , දැන්වීම් , ශබ්ද විකාශන යන්ත්‍රය

37. ධීවර කර්මාන්තයේ දී ගැඹුරු ජලයේ මාළු ඇල්ලීම සඳහා විශේෂයෙන් යොදා ගන්නා උපකරණයකි.

1. 
2. 
3. 

38. විකල්ප බඳුන්වල වගා කොට ඇති බෝග සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,

1. වැඩි ඵලදාවක් ලැබේ 2. සාත්තු කිරීම පහසුය 3. රැගෙන යාම අපහසුය

39. 

මෙම පැණි බීම බෝතලය පිටත කොළ පැහැති රවුමේ අදහස වන්නේ,

1. සාමාන්‍ය සීනි මට්ටමක් ඇත
2. අවම සීනි මට්ටමක් ඇත
3. අධික සීනි මට්ටමක් ඇත


40. දකුණු පළාතෙන් මුහුදට වැටෙන ගංගා ඇතුළත් පිළිතුර වන්නේ,

1. නිල්වලා, කැලණි 2. නිල්වලා , වලවේ 3. මල්වතු ඔය, ගිං ගඟ


41. පාද අටක් , පාද හයක්, පාද හතරක් හා පාද රාශියක් ඇති සතුන් පිළිවෙළින් ඇතුළත් පිළිතුර වන්නේ,

1. මකුළුවා, මීයා, වන්දා, පත්තෑයා 2. මකුළුවා, කැරපොත්තා, ඉබ්බා, දළඹුවා
3. කකුළුවා , මී මැස්සා, වඳුරා , දළඹුවා


42. දණ්ඩ චුම්බක දෙකක ධ්‍රැව ළං කළ විට සිදුවෙන දෙය පිළිබඳව නිවැරදි පිළිතුර තෝරන්න.

**1.** 

විකර්ෂණය

2. 

ආකර්ෂණය

3. 

විකර්ෂණය

43. නොගැළපෙන සේවා සම්බන්ධයක් ඇති පිළිතුර වන්නේ,

1. පදිංචිය සනාථ කිරීම - ග්‍රාම නිලධාරි මහතා
2. ගස් කැපීමට බලපත්‍ර ලබා ගැනීම - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
3. චෙක්පත් මාරු කර ගැනීම - තැපැල් කාර්යාලය

44. කලා වැව හා මින්නේරිය වැව නිර්මාණය කර වූ රජවරුන් පිළිවෙළින් සඳහන් පිළිතුර වන්නේ,

1. මහසෙන් රජු , පරාක්‍රමබාහු රජු
2. ධාතුසේන රජු , වළගම්බා රජු
3. ධාතුසේන රජු , මහසෙන් රජු

45. පහන් දැල්වීමෙන් ආලෝකවත් කරන උත්සවයක් වන්නේ,

1. මහා ශිව රාත්‍රිය
2. දීපාවලී
3. තෛපොංගල්


46. ඉදිආප්ප , පිට්ටු වැනි ආහාරවල බහුලව අඩංගු පෝෂ්‍ය පදාර්ථය වන්නේ,

1. පිෂ්ටය
2. ප්‍රෝටීන්
3. මේදය

47. සිංහල ශබ්ද කෝෂය සම්පාදනයේ දී මූලිකව ක්‍රියා කළ සාමාජිකයෙකු වන්නේ,

1. ආනන්ද කුමාරස්වාමි
2. සර් ඩී.බී. ජයතිලක
3. එස්. මහින්ද හිමි

48. මෙම මැහුම් ක්‍රමය වන්නේ,



1. කතිර මැස්ම
2. දම්වැල් මැස්ම
3. නැටි මැස්ම


49. වැරදි ආහාර පුරුදු නිසා ඇතිවන රෝගයක් නොවන්නේ,

1. දියවැඩියාව
2. පිලිකා
3. මැලේරියාව

50. යම් පුද්ගලයෙකු ගින්දරට පිළිස්සුණු අවස්ථාවක නොකළ යුතු දෙයකි.



1. සිසිල් ජලයෙන් සිසිල් කිරීම
2. දන්තාලේප ආලේප කිරීම
3. බිම පෙරළීම

51. පහත දැක්වෙන පරීක්ෂණයට අනුව මඳ වේලාවකින් ටිෂූ කඩදාසියට සිදු වන්නේ කුමක් ද?




1. ටිෂූ කඩදාසිය තෙත් වේ
2. ටිෂූ කඩදාසිය නිල් පැහැයෙන් දිස් වේ
3. ටිෂූ කඩදාසිය දම් පැහැ වේ

52. බෝතලයකට ජලය දමා සිදුරු තුනක් විදීමෙන් පසු බෝතලයේ ජලය පිටතට පැමිණිය හැකි ආකාරය වන්නේ,


1. 
2. 
3. 


53. රථවාහන ආලෝක සංඥාවල ''රතු පැහැති මිනිසා'' දිස්වන අවස්ථාවල දී සිදු විය යුතු දෙයකි,


1. මාර්ගයේ වාහන ධාවනය කිරීම
2. පදිකයින් පාර හරහා මාරුවීම
3. රථවාහන ධාවනය නොකිරීම

54. බෝග වගා කිරීමේ දී කෘමි හානි අවම කර ගැනීම සඳහා සිටුවන ලද ශාකයකි.
1. පැපොල් 2. කෝමාරිකා 3. දාස්පෙතියා

55. පහත දැක්වෙන අවස්ථා ඇසුරෙන් විදුලි බුබුළ නොදැල්වෙන අවස්ථාව දැක්වෙන පිළිතුර වන්නේ,

1. 

2. 




3. 


56. මිනිසුන් තුළ තිබිය යුතු හොඳ ගතිගුණයක් නොවන්නේ,
1. ආදරය 2. වෛරය 3. කරුණාව

57. කඳු නායයෑමකට පෙර පරිසරයේ වෙනස්කම් සිදුවේ. ඉන් සිදුවෙන එක වෙනස්කමක් වන්නේ,
1. තදින් සුළං හැමීම 2. පොළොව සෙලවීම
3. දිය උල්පත් බොර පැහැය වීම

58. ඇස පමණක් මුල්කරගෙන තොරතුරු ලබා ගන්නා ක්‍රමයක් නොවේ,
1. පෝස්ටර් 2. රූපවාහිනිය 3. සඟරා

59. අධිවේගී මාර්ගය, දුම්රිය මාර්ගය, මහා මාර්ගය සිතියමක දක්වන වර්ණයන් පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ,
1. දම් , රතු , කළු 2. රතු , දම්, කළු 3. දම්, කළු, රතු

60.   

ඉහත උපකරණ භාවිතා කරන කර්මාන්ත පිළිවෙළින්,
1. වඩු කර්මාන්තය, පෙදරේරු කර්මාන්තය, කෘෂි කර්මාන්තය
2. පෙදරේරු කර්මාන්තය, වඩු කර්මාන්තය, කෘෂි කර්මාන්තය
3. කෘෂි කර්මාන්තය , පෙදරේරු කර්මාන්තය, වඩු කර්මාන්තය

**61. පස්වන ශ්‍රේණියේ ඉගෙන ගන්නා ශිෂ්‍යයෙකු හෝ ශිෂ්‍යාවක ලෙස ඔබ පාසල තුළ දී ඇති කර ගත යුතු හොඳ පුරුදු යන මාතෘකාව යටතේ නිර්මාණාත්මක වාක්‍ය තුනක් ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට නො අඩු විය යුතු අතර උක්ත ආඛ්‍යාත සම්බන්ධය සහ අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුය.)**

1. ..................................................................................................................
..................................................................................................................
2. ..................................................................................................................
..................................................................................................................
3. ..................................................................................................................
..................................................................................................................